කාර්ය සාධන වාර්තාව

2018

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

ජය මාවත, කටුබැද්ද, මොරටුව.
දුරකථන අංකය : 011-2044860
ෆැක්ස් අංකය : 011-2044879
වෙබ් අඩවිය : http://www.csd.lk

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය ...

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වර්තමාන ප්‍රගතිය පිළිබඳව සනිටුහන් වන 2018 කාර්ය සාධන වාර්තාවට මෙම පණිවුඩය නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මා අතිශයින් සතුටු වෙමි.

තිස් වසරක කුරිරු යුද්ධය අවසන් කිරීමට සුවිශේෂී දායකත්වයක් දැක් වූ සිවිල් ආරක්ෂක බලකාය 2006 සැප්තැම්බර් මස 13 වන දින සිට "සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව " බවට පරිවර්තනය වූ අතර, 2015 වර්ෂයේ දී දෙපාර්තමේන්තු සාමාජිකයින්ගේ පිරිස් බලය වඩාත් ඵලදායී ලෙස උපයෝජනය කරමින් ආදායම් උපදවන ආයතනයක් බවට පරිවර්තනය කරන ලදී. 2015 අප්‍රේල් මස 23 වන දින සිට දෙපාර්තමේන්තු සාමාජිකයින්ගේ සේවය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවාවක් බවට පත් කරමින් ආයතන තවදුරටත් ශක්තිමත් කරන ලදී. පරිපූරක හමුදාවක් ලෙස සිදු කළ කාර්යභාරයෙන් ඔබ්බට ගොස් අද වන විට මෙම දෙපාර්තමේන්තුව රටේ සංවර්ධනයට උර දෙමින් රාජ්‍ය භාණ්ඩාගාරය සඳහා විශාල ආදායමක් උපදවන ආයතනයක් ලෙස ද ප්‍රමුඛ ව කටයුතු කරනු ලබයි.

2018 දෙසැම්බර් 31 වන දිනට පොලිස් දෙපාර්තමේන්තු රාජකාරීන් සඳහා භටයින් 2300කට ආසන්න සංඛ්‍යාවක් ද, අලි පලවා හැරීමේ රාජකාරීන් හා අලි වැට ඉදි කිරීමේ ව්‍යාපෘති සඳහා තවත් භටයින් 2200ක් පමණ ද, පුරාවිද්‍යා භූමි සංරක්ෂණ කටයුතු සඳහා භටයින් 230ක් ද, විහාරස්ථානවල ආරක්ෂක රාජකාරි සඳහා 1300කට ආසන්න ප්‍රමාණයක් ද අනුයුක්ත කරමින් දෙපාර්තමේන්තුවේ සේවය තවදුරටත් පුළුල් කර ඇත.

එසේම දෙපාර්තමේන්තු භට පිරිස් දිවයිනේ සෑම ප්‍රදේශයක් ම ආවරණය වන පරිදි බළකා මූලස්ථාන 23ක්, පුහුණු පාසල් 06ක් හා උප බලකා 07ක් වෙත අනුයුක්තව රාජකාරීන් සඳහා යොදවා ඇත. ඔවුන් විසින් දිවයිනේ එක් එක් ප්‍රදේශවලට ආවේණික එළවළු, පළතුරු හා ධාන්‍ය වැනි කෘෂිකාර්මික ව්‍යාපෘති ද, පශු පාලන ව්‍යාපෘති, ගඩොල් ව්‍යාපෘති හා විවිධ අත්කම් භාණ්ඩ නිෂ්පාදනය ද, රාජ්‍ය ආයතනවල පෞද්ගලික ආරක්ෂක රාජකාරීන් වැනි වෙනත් ව්‍යාපෘති සඳහා ද තම දායකත්වය දක්වනු ලබයි. ඊට අමතරව රටේ සංවර්ධනයට සෘජුව ම තම දායකත්වය සපයමින් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල මධ්‍යම හා කුඩා පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ද ශ්‍රම දායකත්වය ලබා දෙනු ලබයි. රටේ අධ්‍යාපන, ආගමික හා සංස්කෘතික පුනරුදය වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ද සුවිශේෂී වන අතර, සෞඛ්‍ය සම්පන්න ජාතියක් නිර්මාණය කිරීමේ මහඟු කාර්යය සඳහා ඩෙංගු මර්දන ව්‍යාපෘති, මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු, ලේ දන්දීමේ ව්‍යාපෘති හා වකුගඩු රෝගය මර්දන ව්‍යාපෘති මගින් ලබා දී ඇති දායකත්වය අතිමහත්ය. තවද, ජාතින් අතර සහජීවනය ඇති කරනු වස් පුනරුත්ථාපනය වූ දමිළ තරුණ තරුණියන් 3500කට ආසන්න පිරිසක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට බඳවා ගෙන උතුරු පළාත තුළ විශේෂයෙන් කිලිනොච්චි, මුලතිව් දිස්ත්‍රික්කවල කෘෂිකාර්මික හා අනෙකුත් සංවර්ධන කටයුතුවලට ඵලදායී ලෙස යොදා ගනිමින් සංහිඳියාව ප්‍රායෝගිකව ඇති කරමින් සිටියි.

දෙපාර්තමේන්තු භට/භටවරියන් සියලු දෙනාට ම ස්ථිර පත්වීම් ප්‍රදානය හා විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ කර ක්‍රමවත්ව පවත්වාගෙන යාම ද සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ය. එමෙන්ම දෙපාර්තමේන්තුව තුළ භටයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සුබසාධනය වෙනුවෙන් පිහිටුවා ඇති යහසාධක අරමුදල, සුවසවිය අරමුදල, වකුගඩු අරමුදල තුළින් ප්‍රතිලාභ විශාල ප්‍රමාණයක් ඔවුන් වෙත ප්‍රදානය කරනු ලබයි.

නිරන්තර පුහුණුව තුළින් භටයන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනයත්, ඒ තුළින් ඔවුන්ගේ සේවා තෘප්තිය වැඩි දියුණු කිරීමත්, ඔවුන් ඵලදායී ලෙස සේවයේ යෙදවීමත් අරමුණු වේ. එමගින් ඔවුන්ගේ ආර්ථික, සාමාජික හා සංස්කෘතික වර්ධනය ඇති කිරීම හා ඒ තුළින් රටේ සංවර්ධනය සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙතෙක් ඉටු කරන ලද සත්කාර්යයන්ට අමතරව ඉදිරියේ දී ද මාතෘ භූමියේ සංවර්ධනය හා සමාජ සත්කාර්යයන් සමඟින් දේශයේ සංවර්ධනයට අපගේ උපරිම දායකත්වය ලබාදීමට අපේක්ෂා කරන අතර, එම බලාපොරොත්තු සඵල කර ගැනීමට ත්‍රිවිධ හමුදා හා පොලිස් කාර්ය මණ්ඩලයටත්, සිවිල් කාර්ය මණ්ඩලයටත්, සියලුම සිවිල් ආරක්ෂක සාමාජික සාමාජිකාවන්හටත් ශක්තිය ධෛර්යය ලැබේවායි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය ...

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 2018 වසර තුළ කළ මෙහෙවරයන්හි ප්‍රගතිය පිළිබඳ සඳහන් කරන කාර්යසාධන වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මහත් භාග්‍යයක් සේ සලකමි.

අප මාතෘ භූමිය ත්‍රස්තවාදී තර්ජනවලට මුහුණ පා සිටි අවධියේ ත්‍රිවිධ හමුදාවට සහ පොලිසියට සිය දායකත්වය ලබාදෙමින් තර්ජිත ගම්මාන සුරකිමින් සිවිල් ආරක්ෂක බලකාය මහත් මෙහෙවරක් ඉටු කරන ලදී. වර්තමානයේ රටේ සංවර්ධන ක්‍රියාවලියට සෘජුව දායක වෙමින් ගමටත් නගරයටත් තම ශ්‍රමය හා මෙහෙවර ලබාදෙන අතර අද වන විට මෙම පිරිස රාජ්‍ය සේවයේ ස්ථීර විශ්‍රාම වැටුප් හිමි ක්‍රියාකාරී පිරිසක් බවට පරිවර්තනය වී ඇත.

තව ද, ආගමික ස්ථාන හා පූජා භූමි ආරක්ෂා කිරීම මෙන් ම වන අලි තර්ජනවලින් ජනතාව මුදා ගැනීම් වස් අලි වැටවල් ඉදිකිරීම අප දෙපාර්තමේන්තුව විසින් දායකත්වය දක්වන්නා වූ තවත් සේවාවන් වේ.

එමෙන්ම රාජ්‍ය ආයතනවලට ආරක්ෂාව සැපයීම ද අප දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන සුවිශේෂී සේවා වේ.

පසුගිය වසරේ සාර්ථකත්වය සඳහා පෙර සිටි ආරක්ෂක අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමන් හා අප දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් චන්ද්‍රරත්න පල්ලේගම මැතිතුමාගෙන් ලද උපදෙස් හා මගපෙන්වීම බෙහෙවින් උපකාරී වූවා මෙන්ම ඒ සබැඳව මා විසින් මෙම අවස්ථාවේ දී කෘතඥතා පූර්වකව සිහිපත් කිරීම මාගේ යුතුකමක් වේ.

එමෙන්ම පසුගිය වසරේ සාර්ථකත්වය සඳහා දෙපාර්තමේන්තුව සමග රාජකාරී කරන ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සියලුම නිලධාරීන් සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ හා ඒකාබද්ධ සේවාවල සියලුම නිලධාරී මහත්ම මහත්මීන් මෙන්ම සිවිල් ආරක්ෂක බලකායේ සියලුම නිලධාරීන් වෙත මාගේ ස්තුතිය පුදකර සිටිමි.

ඉදිරි වර්ෂයන්හිදී ද මෙවැනි මහත් වූ කාර්යයන් ඉටුකිරීමට අප දෙපාර්තමේන්තුවේ සාමාජික සාමාජිකාවන් හට අවශ්‍ය ශක්තිය හා ධෛර්ය ලැබේවායි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

ඩී.සී. ගුණවර්ධන, ආර්ඩබ්ලිව්**,ආර්එස්පී,වීඑස්වී,යූඑස්පී,එන්එස්ඩබ්ලිව්,පීඑස්පී
රියර් අද්මිරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

දෙපාර්තමේන්තු පරිපාලන කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය

• අධ්‍යක්ෂ ජනරාල්	*චන්ද්‍රරත්න පල්ලේගම මහතා (2018.01.01 – 2018.04.16)*	*071-8650901/ 011-2588116*
	මේජර් ජනරාල් නිර්මාල් කොස්වත්ත (2018.07.05 – 2018.12.31)	*071-8650900/011-2588116*
• අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	*රියර් අද්මිරාල් ඩී.සී. ගුණවර්ධන*	*071-2027413/011-2554643*
• අධ්‍යක්ෂ (පාලන)	*එච්.කේ.එන්. ප්‍රියන්ගිකා මෙය*	*070-2466288/011-2556004*
• අධ්‍යක්ෂ (මුදල්)	*ජී.ජී.එස්. ප්‍රියන්ත මහතා*	*071-8083150/011-2506723*
• අධ්‍යක්ෂ (පිරිස් පාලන)	*මේජර් ජනරාල් පී.බී.ඩී. ඩයස්*	*071-4281340/011-2506259*
• අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන / ප්‍රවාහන)	*කොමදෝරු ඩී. පෙරේරා*	*071-6411529/011-5740095*
• අධ්‍යක්ෂ (ව්‍යාපෘති)	*ලුතිනන් කර්නල් පී.ඩී.එච්.කේ. විජේනායක*	*0716411814/011-3144655*
• අධ්‍යක්ෂ (මෙහෙයුම්)	*කපිතාන් කේ. උඛෙසේකර*	*071-8650902/011-2055856*
• අධ්‍යක්ෂ (පුහුණු)	*බ්‍රිගේඩියර් ඩී.සී.ජේ.ඩබ්. ජයසේකර*	*071-2027172/011-3133568*
• අධ්‍යක්ෂ (සුඛසාධක / මාධ්‍ය / සංගීත හා සෞන්දර්ය/ යහසාධක/ සුවසවිය/ජනශක්ති රක්ෂණ අරමුදල/ විමර්ශන / හැඳුනුම්පත්), මාධ්‍ය ප්‍රකාශක,	*ලුතිනන් කර්නල් ඊ.පී.ඒ. මංගල*	*071-5565897/ 011-2081558*
• නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ)	*ලුතිනන් කමාන්ඩර් එල්.ජේ.එම්. බණ්ඩාරනිලක*	*071-4445935*
• නියෝජ්‍ය අධ්‍යක්ෂ (පිරිස් පාලන)	*මේජර් ඩබ්.එම්.එස්.ආර්. වීරකෝන්*	*071-2027178/011-2556958*
• නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්)	*මේජර් ඩබ්.ඒ.එස්.පී. වියතුංග*	*071-9734218/ 011-2556960*
• සහකාර අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)	*එම්.ටී.අයි.එස්. කරුණාසේන*	*071-8650912/ 011-5733270*
• සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)	*ජේ.ඒ. ජෙරීඩ් මහතා*	*071-8650911/ 011-5733900*
• සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති ගිණුම්)	*ඩී.එම්. සජීවනී මෙය*	*071-2188179/ 011-2556861*
• මූලස්ථාන අණදෙන නිලධාරී, ක්‍රීඩා ලේකම්, සහකාර අධ්‍යක්ෂ (ප්‍රවාහන)	*ලුතිනන් කර්නල් ඩී.එස්. රණසිංහ*	*077-3842194/ 011-2587404*

බලකා මූලස්ථාන සහ පුහුණු පාසල් අණදෙන නිලධාරීන්

• අනුරාධපුර බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් පී.එස්. අමරසිංහ*	*077-7752269/ 025-2054211*
• අම්පාර බලකා මූලස්ථානය	*කපිතාන් එම්.එෆ්.ඒ.කේ. ද සිල්වා*	*077-3447443/ 063-2242051*
• උහන බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් ටී.එම්.බී.ජී. තෙන්නකෝන්*	*071-8298216/ 063-2051288*
• විශ්වමඩු මූලස්ථානය	*ලුතිනන් කර්නල් එම්.ජී.ඒ. මලන්දෙණිය*	*071-6410843/ 020-3734882*
• කිලිනොච්චි බලකා මූලස්ථානය	*මේජර් ඒ.ආර්. ඉඹුල්දෙනිය*	*077-3266171/ 021-2285955*
• ගෝමරන්කඩවල බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් එච්.එම්.පී. සේනාරත්න*	*071-8063862/026-2255069*
• ත්‍රිකුණාමලය බලකා මූලස්ථානය	*කර්නල් ආර්.එම්.එස්.එම්.බී. වීරකෝන්*	*071-4961678/026-2234033*
• පුත්තලම බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් එම්.ජී.ඩී. මහේෂ් කුමාර*	*071-5565927/032-2267444*
• පොළොන්නරුව බලකා මූලස්ථානය	*මේජර් එම්.ඒ.ඩී. කුමාර*	*071-6441541/027-2052599*
• මහඔය බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් එච්.කේ.එස්. ප්‍රියන්ත*	*071-6411577/063-2244154*
• මහනුවර බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් අයි.කේ.ඩබ්. පෙරේරා*	*071-1971648/081-2229681*
• මැදිරිගිරිය බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් ජේ.ඩී.යූ.ටී. කුමාර*	*071-5565895/027-2245929*
• මුලතිව් බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් ජේ.ආර්.එල්. හරිස්චන්ද්‍ර*	*071-8410550/021-2290251*
• මොණරාගල බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් එස්.කේ.එම්.එම්.එන්.කේ. මහන්තේ*	*071-5565981/055-2055397*
• වව්නියාව බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් බී.ඩී.එම්.ජී. චන්ද්‍රසිරි*	*071-5565962/024-5679600*
• සේරුවිල බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් වයි.ජී.පී.එන්. ජයරත්න*	*071-2028560/026-3123671*
• හොරොව්පොතාන බලකා මූලස්ථානය	*කර්නල් එම්.එම්.යූ. මුණසිංහ*	*071-8572335/025-3249049*
• කටුනායක බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් එල්. රංවගොඩ*	*071-6411742/011-2255144*
• කැබිතිගොල්ලෑව බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් ඊ.එච්.එස්.ආර්. ද සිල්වා*	*071-5565900/025-2298284*
• වැලිඔය බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් ටී.ජී.ඩී.එම්. දිසානායක*	*070-7576307/025-4939352*
• විල්පත්තුව බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් එම්.ඒ. ලක්ෂ්මන්*	*071-4281276/024-5627666*
• වෙන්නවත්ත බලකා මූලස්ථානය	*ලුතිනන් කර්නල් එස්.ජී. කහවේවිතාන*	*071-6411770/011-2533558*
• කතරගම බලකා මූලස්ථානය	*මේජර් බී.කේ.ආර්.යූ. රොද්‍රිගු*	*071-5565887/047-2236346*
• කල්පිටිය පුහුණු පාසල	*මේජර් එස්. ගුණසේකර*	*071-6410510/032-3327466*
• පහළලන්ද පුහුණු පාසල	*ලුතිනන් කර්නල් ආර්.බී.එස්.එස්. සමරවීර*	*071-2367545/063-2242167*
• ගල්කිරියාගම උසස් පුහුණු පාසල	*ලුතිනන් කර්නල් එෆ්.එච්.ඒ. වීරසිංහ*	*071-2264466/025-2052762*
• මිහින්තලේ පුහුණු පාසල	*මේජර් ඩී.එච්.ජී.කේ. දොඩන්දුව*	*071-1972371/025-2052762*
• සේරුපිට සෞන්දර්ය පුහුණු පාසල	*ලුතිනන් කර්නල් එල්. කලංසූරිය*	*071-8604083/034-2289402*

වගු අංක - ii

කෙටි යෙදුම්

1.	ශ්‍රීලංපසේ	ශ්‍රී ලංකා පරිපාලන සේවය
2.	ශ්‍රීලංගසේ	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
3.	දෙපාර්.	දෙපාර්තමේන්තුගත තනතුරු
4.	රාකසසේ	රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය
5.	කාසේසේ	කාර්යාල සේවක සේවය
6.	කි.මී.	කිලෝමීටර
7.	කි.ග්‍රෑ.	කිලෝග්‍රෑම්

පටුන

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය I

දෙපාර්තමේන්තු පරිපාලන කාර්ය මණ්ඩලය III

අධ්‍යක්ෂ මණ්ඩලය III

බලකා මූලස්ථාන සහ පුහුණු පාසල් අණදෙන නිලධාරීන් IV

කෙටි යෙදුම් V

පටුන VI

1. දෙපාර්තමේන්තුව හැඳින්වීම 1

1.1 ප්‍රතිස්ථාපනය සහ විකාශනය 1

1.2 දැක්ම 1

1.3 මෙහෙවර 1

1.4 කර්තව්‍ය 1

1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින බලකා මූලස්ථාන සහ පුහුණු පාසල් 1

2. කාර්ය සමාලෝචනය - 2018 3

3. කාර්ය මණ්ඩල තොරතුරු 6

3.1 අනුමත කාර්ය මණ්ඩලය 6

3.2 කාර්ය මණ්ඩල වර්ගීකරණය 7

3.3 මානව සම්පත් ව්‍යාප්තිය 7

4. කාර්ය සාධනය - මූලස්ථානය 9

4.1 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය 9

4.2 අභ්‍යන්තර විගණන අංශය 9

4.3 සේවා වනිතා ඒකකය 10

4.4 යහසාධක අරමුදල සහ සුවසවිය අරමුදල 10

4.5 ක්‍රීඩා අංශය 12

4.6 සිවිල් පාලන අංශය 13

4.7 වන්දි අංශය 14

4.8 ගිණුම් අංශය 14

4.9 වැටුප් අංශය 18

4.10 ප්‍රසම්පාදන අංශය 18

4.11 ප්‍රවාහන අංශය 21

4.12 තාක්ෂණ හා නඩත්තු අංශය/ පර්යේෂණ හා සංවර්ධන අංශය 21

4.13 පිරිස් පාලන අංශය 22

4.14 පෞද්ගලික ලිපි ගොනු අංශය 23

4.15 විශ්‍රාම වැටුප් අංශය 24

4.16 ව්‍යාපෘති අංශය 25

4.17 මෙහෙයුම් අංශය 26

4.18 විදුලිවැට සම්බන්ධීකරණ ඒකකය 27

4.19 පුහුණු අංශය 27

4.20 සුබසාධක අංශය 28

4.21 මාධ්‍ය අංශය 29

4.22 හැදුනුම්පත් අංශය 30

4.23 විමර්ශන අංශය 30

5. කාර්ය සාධනය - පුහුණු පාසල 31

5.1 කල්පිටිය පුහුණු පාසල 31
5.2 පහළලන්ද පුහුණු පාසල 32
5.3 ගල්කිරියාගම උසස් පුහුණු පාසල 33
5.4 මිහින්තලේ පුහුණු පාසල 34
5.5 සේරුපිට සෞන්දර්ය පුහුණු පාසල 35
5.6 විශ්වමඩු පුහුණු පාසල 36

6. කාර්ය සාධනය - බලකා මූලස්ථාන 37

6.1 අනුරාධපුර බලකා මූලස්ථානය 37
6.2 අම්පාර බලකා මූලස්ථානය 38
6.3 උහන බලකා මූලස්ථානය 39
6.4 විශ්වමඩු බලකා මූලස්ථානය 40
6.5 කිලිනොච්චි බලකා මූලස්ථානය 41
6.6 ගෝමරන්කඩවල බලකා මූලස්ථානය 42
6.7 ත්‍රිකුණාමලය බලකා මූලස්ථානය 43
6.8 පුත්තලම බලකා මූලස්ථානය 44
6.9 පොළොන්නරුව බලකා මූලස්ථානය 45
6.10 මහඔය බලකා මූලස්ථානය 46
6.11 මහනුවර බලකා මූලස්ථානය 47
6.12 මැදිරිගිරිය බලකා මූලස්ථානය 48
6.13 මුලතිව් බලකා මූලස්ථානය 49
6.14 මොණරාගල බලකා මූලස්ථානය 51
6.15 වව්නියාව බලකා මූලස්ථානය 52
6.16 සේරුවිල බලකා මූලස්ථානය 53
6.17 හොරොව්පොතාන බලකා මූලස්ථානය 54
6.18 කටුනායක බලකා මූලස්ථානය 55
6.19 කැබිතිගොල්ලෑව බලකා මූලස්ථානය 56
6.20 වැලිඔය බලකා මූලස්ථානය 58
6.21 විල්පත්තුව බලකා මූලස්ථානය 59
6.22 වෙන්නවත්ත බලකා මූලස්ථානය 60
6.23 කතරගම බලකා මූලස්ථානය 61

1. දෙපාර්තමේන්තුව හැඳින්වීම

1.1 ප්‍රතිස්ථාපනය සහ විකාශනය

1985 අංක 40 දරන මිනිස් බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනතේ 52 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා පොලිස් සේවාවට ආධාර හා උපකාරී වීමේ කාර්යය සඳහා පිහිටුවන ලද "ග්‍රාමරක්ෂක හමුදාව" 2006.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (අමප/06/135/206/052) අනුව "සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව" නමින් නව දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුව යටතේ බලකා මූලස්ථාන 23ක් සහ පුහුණු පාසල් 07ක් ස්ථාපිත කර ඇති අතර 37,000කට ආසන්න ශ්‍රම බලකායක් සේවයේ යෙදී සිටී.

2015 ජූනි මස 12වැනි සිකුරාදා දිනැතිව නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුවේ පැවති දිස්ත්‍රික් නිලධාරී, පාලක/නියාමක, උප පාලක/ උප නියාමක, ග්‍රාම ආරක්ෂක/ සිවිල් ආරක්ෂක තනතුරු විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට ප්‍රකාශයට පත් කර ඇත. තවද 2015 මාර්තු මස 05 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම දෙපාර්තමේන්තුව සතු සුවිශාල මිනිස් බල සංචිතය ඵලදායී ලෙස යොදා ගනිමින් ග්‍රාමීය ප්‍රදේශවල, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල සංවර්ධන කටයුතු සිදු කිරීමේ හැකියාව සහ දෙපාර්තමේන්තුව ආදායම් උත්පාදනය කරන ආයතනයක් බවට පත්කිරීමේ හැකියාව සලකා දෙපාර්තමේන්තු කාර්යභාරය තවදුරටත් පුළුල් කරනු ලැබීය.

1.2 දැක්ම

"දිවිහිමියෙන් රට රකිමු"

1.3 මෙහෙවර

විජයග්‍රහණයෙන් පසු රටේ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දායකවීම.

1.4 කර්තව්‍ය

1. රටතුළ උද්ගතවන ආරක්ෂක තත්වයන් අනුව අවස්ථාවට උචිත පරිදි සන්නද්ධ සේවාවලට සහ පොලිස් සේවාවට ආධාර හා උපකාරීවීම සඳහා පරිපූරක හමුදාවක් වශයෙන් කටයුතු කිරීම
2. ත්‍රස්තවාදී තර්ජන පවතින අවස්ථාවලදී ඊට ලක්වන ගම්බිම් හා නගර ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම
3. රට තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා සන්නද්ධ සේවාවලට සහ පොලිස් සේවාවට සහාය දීම
4. ජාතික වැදගත්කමක් ඇති උත්සව හා වෙනත් වැදගත් අවස්ථාවන්හිදී ඊට අදාළ ආරක්ෂාව සැලසීමේ කටයුතුවල යෙදීම
5. රට තුළ ඇතිවන විවිධ ආපදා (ගං වතුර, නායයෑම්, සුනාමිවැනි) අවස්ථාවන්හිදී ආපදා කළමනාකරණ කාර්යයන්වලට සහාය වීම
6. පළාත් සභා සහ පළාත් පාලන ආයතන, විහාරස්ථාන හා ආගමික සිද්ධස්ථාන ආදියෙහි සුළු හා මධ්‍යම පරිමාණ ඉදිකිරීම් කටයුතු ඉටු කරවා ගැනීමේදී ශ්‍රම බලකායේ සේවය ලබාදීම
7. රාජ්‍ය ආයතනවලට ආරක්ෂක සේවා සපයා ගැනීමේදී මෙම දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම් ගතවආරක්ෂක සේවාවන් ලබාදීම
8. දෙපාර්තමේන්තුව සතු සංස්කෘතික කණ්ඩායම් වල සේවය රාජ්‍ය ආයතනවල උත්සව අවස්ථාවන් සඳහා ලබාදීම
9. අලි මිනිස් ගැටුම් හේතුවෙන් අදාළ ප්‍රදේශවල සිදුවන හානි අවම කිරීම පිණිස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහායවීම සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සේවය එම දෙපාර්තමේන්තුවෙත ලබා දීම
10. දිවයින පුරා පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකම සහිත ස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම සහ සංචාරක වශයෙන් වැදගත්කමක් ඇති ස්ථාන සඳහා අවශ්‍ය වන පරිදි ආරක්ෂාව සැලසීම
11. සමාජ සුබසාධන ක්‍රියාකාරකම් වලට සහායවීම
12. ජනාධිපතිතුමා, විෂයභාර අමාත්‍යතුමා හෝ රජය විසින් නියම කරනු ලබන විශේෂිත කාර්යයන් වල යෙදීම

1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ බලකා මූලස්ථාන 23 ක් සහ පුහුණු පාසල් 07ක් ක්‍රියාත්මක වන අතර බලකා මූලස්ථාන/ පුහුණු පාසල් අණදෙන නිලධාරීන් සහ දෙවන අණදෙන නිලධාරීන් මඟින් එකිනෙක බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්හි පරිපාලන කටයුතු සිදු වේ.

දෙපාර්තමේන්තුව සතු 37,000කට ආසන්න මානව සම්පත විවිධ ක්ෂේත්‍රයන් කෙරෙහි යොමු කරවීම දෙපාර්තමේන්තු මූලස්ථානය මඟින් සෘජුවම සහ බලකා මූලස්ථාන/ පුහුණු පාසල්වල මෙහෙයවීමෙන්

සිදු වන අතර ඊට සමගාමීව කෘෂිකාර්මික, සත්ව පාලන, සුළු පරිමාණ නිෂ්පාදන ව්‍යාපෘති (උදා: කොසු, ඉදල්, ගඩොල්, බ්ලොක් ගල් ආදී) හා වෙනත් ව්‍යාපෘති පවත්වා ගෙන යාම සිදුවේ.

බලකා මූලස්ථාන සහ පුහුණු පාසල් පහත පරිදි වේ.

<u>බලකා මූලස්ථාන - 23</u>

1. අනුරාධපුර බලකා මූලස්ථානය
2. අම්පාර බලකා මූලස්ථානය
3. උහන බලකා මූලස්ථානය
4. විශ්වමඩු බලකා මූලස්ථානය
5. කිලිනොච්චි බලකා මූලස්ථානය
6. කැබිතිගොල්ලෑව බලකා මූලස්ථානය
7. ගෝමරන්කඩවල බලකා මූලස්ථානය
8. ත්‍රිකුණාමලය බලකා මූලස්ථානය
9. පුත්තලම බලකා මූලස්ථානය
    a. කුරගල ව්‍යාපෘතිය
10. පොළොන්නරුව බලකා මූලස්ථානය
11. මහඔය බලකා මූලස්ථානය
12. මහනුවර බලකා මූලස්ථානය
13. මැදිරිගිරිය බලකා මූලස්ථානය
14. මුලතිව් බලකා මූලස්ථානය
15. මොණරාගල බලකා මූලස්ථානය
16. වව්නියාව බලකා මූලස්ථානය
17. වැලිඔය බලකා මූලස්ථානය
18. විල්පත්තුව බලකා මූලස්ථානය
19. වෙන්නච්ච්ත බලකා මූලස්ථානය
20. සේරුවිල බලකා මූලස්ථානය
21. හොරොව්පොතාන බලකා මූලස්ථානය
22. කටුනායක බලකා මූලස්ථානය
23. කතරගම බලකා මූලස්ථානය

<u>පුහුණු පාසල් - 07</u>

1. කල්පිටිය පුහුණු පාසල
2. පහළලන්ද පුහුණු පාසල
3. ගල්කිරියාගම උසස් පුහුණු පාසල
4. මිහින්තලේ පුහුණු පාසල
5. සේරුපිට සෞන්දර්ය පුහුණු පාසල
6. අරලගංවිල පුහුණු පාසල
7. විශ්වමඩු පුහුණු පාසල

දෙපාර්තමේන්තු මූලස්ථානය මඟින් බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්වලට අදාළ පාලන කටයුතු සිදු කරන අතර දෙපාර්තමේන්තු මූලස්ථානයෙහි අංශ 26ක් යටතේ එම පාලන කාර්යයන් විමධ්‍යගත කර ඇත.

i. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය
ii. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
iii. අභ්‍යන්තර විගණන අංශය
iv. සේවා වනිතා ඒකකය
v. යහසාධක අරමුදල
vi. සුවසවිය අරමුදල
vii. ක්‍රීඩා අංශය
viii. සිවිල් පාලන අංශය
ix. වන්දි අංශය
x. ගිණුම් අංශය
xi. වැටුප් අංශය
xii. ප්‍රසම්පාදන අංශය
xiii. ප්‍රවාහන අංශය
xiv. තාක්ෂණ හා නඩත්තු අංශය
xv. පර්යේෂණ හා සංවර්ධන අංශය
xvi. පිරිස් පාලන අංශය
xvii. පෞද්ගලික ලිපි ගොනු අංශය
xviii. විශ්‍රාම වැටුප් අංශය
xix. ව්‍යාපෘති අංශය
xx. මෙහෙයුම් අංශය
xxi. විදුලි වැට සම්බන්ධීකරණ ඒකකය
xxii. පුහුණු අංශය
xxiii. සුබසාධක අංශය
xxiv. මාධ්‍ය අංශය
xxv. හැඳුනුම්පත් අංශය
xxvi. විමර්ශන අංශය

එක් එක් බලකා මූලස්ථාන, පුහුණු පාසල් සහ දෙපාර්තමේන්තු මූලස්ථානයෙහි අංශයන්ට අදාළව 2018 වර්ෂය සඳහා සැලසුම්ගත කාර්යයන්හි කාර්යසාධනය වෙන් වෙන්ව දක්වා ඇත.

2. කාර්ය සමාලෝචනය - 2018

<u>පරිපූරක හමුදාවක් ලෙස ක්‍රියා කිරීම</u>

යුද සමයේදී එම කටයුතු සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සක්‍රීය දායකත්වය ලබා දුන් අතර මානුෂීය මෙහෙයුමෙන් අනතුරුව රටතුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා පොලිස් සේවාවට සහාය වීම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයක් වේ. ඒ අනුව 2018 වර්ෂය තුළ දිවයින පුරා පොලිස් ස්ථාන 290 ක් සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින් 2400ක් අනුයුක්ත කරනු ලැබීය.

<u>උත්සව සහ වැදගත් අවස්ථා</u>

ජාතික වැදගත්කමක් ඇති උත්සව සහ වෙනත් වැදගත් අවස්ථාන්හිදී සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ දායකත්වය ලබා දෙන අතර 2018 වර්ෂයේ ජාතික නිදහස් උත්සවය සඳහා සෙසු නිල සහ සිවිල් ආරක්ෂක සාමාජික සාමාජිකාවන් 700 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සහභාගී කරවීය.

<u>විහාරස්ථානයන්හි සේවයේ යෙදවීම</u>

ලංකාව පුරා වෙහෙර විහාරවල අභිවෘද්ධිය සඳහා එම විහාරස්ථානවල නඩත්තු හා ඉදිකිරීම් කටයුතු සඳහා, ආරක්ෂක කටයුතු සඳහා මෙන්ම රියදුරු සේවා සැපයීම සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ දායකත්වය ලබා දී ඇත. 2018 වර්ෂය තුළ දිවයන පුරා විහාරස්ථාන ඇතුළු ආගමික සිද්ධස්ථාන 547ක එම කාර්යයන් සඳහා යොදවා ඇති සාමාජික සංඛ්‍යාව 1297කි.

<u>ආරක්ෂක සේවා සැපයීම</u>

රාජ්‍ය ආයතනයන්හි ආරක්ෂක රාජකාරි පෞද්ගලික ආරක්ෂක නිලධාරීන් යොදවා සිදු කළ අතර ඒ සඳහා වැයවන පිරිවැය අවම කිරීමේ අරමුණින් රාජ්‍ය ආයතනවල ආරක්ෂක රාජකාරි සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින් යෙදවීම සිදුවිය. ඒ අනුව 2018 වර්ෂය තුළ රාජ්‍ය ආයතන 134ක ආරක්ෂක රාජකාරි ඉටු කිරීම සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින් 2493ක් යොදවා ඇත.

<u>විදුලි වැට ඉදිකිරීම් හා නඩත්තු කටයුතු</u>

අලි මිනිස් ගැටුම අවම කිරීමේ අරමුණින් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහාය වීම පිණිස සිවිල් ආරක්ෂක සාමාජිකයින් යොදවා ඇති අතර 2018 වර්ෂයේදී 2248ක හට පිරිසක් ඊට දායකත්වය ලබා දී ඇත.

පුරාවිද්‍යා ස්ථානවල සේවයේ යෙදවීම

පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සඳහා ආරක්ෂාව සැලසීමේ අරමුණින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහාය සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින් 230 දෙනෙකු පුරා විද්‍යා ස්ථාන 101 ක සේවයෙහි යොදවා ඇත.

සමාජ සුබ සාධන ක්‍රියාකාරකම්

ජනාධිපති ලේකම් කාර්යාලය හා එක්ව 2018 වර්ෂයේදී ඩෙංගු මර්දන ශ්‍රමදාන කටයුතු දීප ව්‍යාප්තව ස්ථාන 60කදී සිවිල් ආරක්ෂක බලකා මූලස්ථාන සහ පුහුණු පාසල් මඟින් යොදවන ලද 1500ක හට පිරිසක් මගින් ඉටු කළ අතර එම කටයුතු ඉදිරියට ද එලෙසම ක්‍රියාත්මක කරනු ලබයි.

ආදායම් ඉපයීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ පවතින බලකා මූලස්ථාන සහ පුහුණු පාසල් මඟින් මූලික කාර්යභාරයන්ට සමගාමීව විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව 2018 වර්ෂයේද කෘෂි කාර්මික, පශු පාලන, ගඩොල්/ බ්ලොක්ගල් නිෂ්පාදන, ඉදල්/ කොසු නිෂ්පාදන, අත්කම් නිෂ්පාදන ආදී විවිධ ව්‍යාපෘති රැසක් රජය සතු ඉඩම් සහ සාමාජිකයින්ගේ ඉඩම් භාවිතා කරමින් සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ක්‍රියාවට නංවා ඇත.

එළවලු වගා ව්‍යාපෘති

වී වගා ව්‍යාපෘති

පශු පාලන ව්‍යාපෘති

ගඩොල් නිෂ්පාදන ව්‍යාපෘති

බ්ලොක් ගල් නිෂ්පාදන ව්‍යාපෘති

ඉදල් නිෂ්පාදන ව්‍යාපෘති

අත්කම් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපෘති

අභ්‍යාස පොත් නිෂ්පාදන ව්‍යාපෘති

වළං නිෂ්පාදන ව්‍යාපෘති

එල්.ඊ.ඩී. බල්බ නිෂ්පාදන ව්‍යාපෘති

එම ව්‍යාපෘතිවලින් උපයන ආදායම් ඒකාබද්ධ අරමුදලට සෘජුවම බැර කරනු ලැබේ.

3. කාර්ය මණ්ඩල තොරතුරු

3.1 අනුමත කාර්ය මණ්ඩලය

අනු අංකය	තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් කේතය	සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	2018.12.31 දිනට සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
1	අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රීලංපසේ		SL3	1	1	1	-
2	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	දෙපාර්.	-	-	1	1	1	-
3	ගණකාධිකාරි	ශ්‍රීලංගසේ	I	SL1	1	1	1	-
4	අධ්‍යක්ෂ - පාලන	ශ්‍රීලංපසේ	I	SL1	1	1	1	-
5	අධ්‍යක්ෂ - මෙහෙයුම්	දෙපාර්.	-	-	1	1	1	-
6	අධ්‍යක්ෂ - පුහුණු	දෙපාර්.	-	-	1	1	1	-
7	අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන	දෙපාර්.	-	-	1	1	1	-
8	අධ්‍යක්ෂ - ඉදිකිරීම් හා ව්‍යාපෘති	දෙපාර්.	-	-	1	1	1	-
9	අධ්‍යක්ෂ - පර්යේෂණ හා සැලසුම්	දෙපාර්.	-	-	1	1	-	1
10	අධ්‍යක්ෂ - සුබසාධන හා සෞන්දර්ය	දෙපාර්.	-	-	1	1	1	-
11	අධ්‍යක්ෂ - පිරිස් පාලන	දෙපාර්.	-	-	1	1	1	-
12	නියෝජ්‍ය අධ්‍යක්ෂ -මෙහෙයුම්	දෙපාර්.	-	-	1	2	1	1
13	නියෝජ්‍ය අධ්‍යක්ෂ - පුහුණු	දෙපාර්.	-	-	1	1	-	1
14	නියෝජ්‍ය අධ්‍යක්ෂ - ඉදිකිරීම් හා ව්‍යාපෘති	දෙපාර්.	-	-	1	1	-	1
15	නියෝජ්‍ය අධ්‍යක්ෂ - සුබසාධන හා සෞන්දර්ය	දෙපාර්.	-	-	1	1	-	1
16	නියෝජ්‍යඅධ්‍යක්ෂ - නාක්ෂණ	දෙපාර්.	-	-	1	1	1	-
17	නියෝජ්‍ය අධ්‍යක්ෂ - ප්‍රවාහන	දෙපාර්.	-	-	1	1	-	1
18	නියෝජ්‍ය අධ්‍යක්ෂ - පර්යේෂණ හා සැලසුම්	දෙපාර්.	-	-	1	1	-	1
19	ගණකාධිකාරි	ශ්‍රීලංගසේ	III/ II	SL1	1	2	2	-
20	අභ්‍යන්තර විගණක	ශ්‍රීලංගසේ	II	SL1	1	1	1	-
21	සහකාර අධ්‍යක්ෂ - පාලන	ශ්‍රීලංපසේ	III	SL1	1	1	-	1
22	අණදෙන නිලධාරී	දෙපාර්.	-	-	2	22	22	-
23	දෙවන අණදෙන නිලධාරී	දෙපාර්.	-	-	2	27	14	13
24	පුහුණු පාසල් අණදෙන නිලධාරී	දෙපාර්.	-	-	2	5	5	-
25	උපබලකා අණදෙන නිලධාරී	දෙපාර්.	-	-	2	12	-	12
26	මාණ්ඩලික නිලධාරී	දෙපාර්.	-	-	2	12	6	6
27	මූලස්ථාන මාණ්ඩලික නිලධාරී	දෙපාර්.	-	-	2	1	1	-
28	පරිපාලන නිලධාරී	රාකසසේ	අධි පන්තිය	MN 7	2	1	-	1
29	නාක්ෂණ නිලධාරී	දෙපාර්.	-	-	2	4	-	4
30	මූල්‍ය සහකාර	ආශ්‍රිත නිලධාරී	-	MN 4	3	1	-	1
31	සංවර්ධන නිලධාරී	ආශ්‍රිත නිලධාරී	-	MN 4	3	5	3	2
32	රාජ්‍ය කළමනාකරණ සහකාර	රාකසසේ	III/ II/I	MN 2	3	20	16	4

33	රියදුරු	රියදුරු සේවය	III/ II/I /විශේෂ	PL 3	4	30	20	10
34	දිස්ත්‍රික් නිලධාරී	දෙපාර්.	විශේෂ	PL 2	4	100	19	81
35	පාලක/නියාමක	දෙපාර්.	I	PL 2	4	3200	2436	764
36	නියාමක විශේෂ ශ්‍රේ. රියදුරු	දෙපාර්.	විශේෂ	PL 2	4	30	-	30
37	නියාමක රියදුරු	දෙපාර්.	I	PL 2	4	70	-	70
38	උපපාලක/ උප නියාමක	දෙපාර්.	II	PL 2	4	6510	5664	846
39	උපනියාමක රියදුරු	දෙපාර්.	II	PL 2	4	90	-	90
40	ග්‍රාමරක්ෂක/ සිවිල් ආරක්ෂක	දෙපාර්.	III	PL 2	4	29790	28404	1386
41	සිවිල් ආරක්ෂක රියදුරු	දෙපාර්.	III	PL 2	4	210	-	210
42	සනීපාරක්ෂක කම්කරු	කාසේසේ	III	PL 1	4	30	22	8
එකතුව						40193	36647	3546

වගු අංක - 3.1.1

3.2 කාර්ය මණ්ඩල වර්ගීකරණය

සේවා මට්ටම අනුව දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල වර්ගීකරණය

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවත්නා සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	23	15
තෘතීයික	84	48
ද්විතියික	26	19
ප්‍රාථමික	40060	36565
එකතුව	**40193**	**36647**

වගු අංක - 3.2.1



ප්‍රස්තාර අංක - 3.2.1

3.3 මානව සම්පත් ව්‍යාප්තිය

දෙපාර්තමේන්තු මූලස්ථානය සහ ඒ යටතේ පවතින බලකා මූලස්ථාන හා පුහුණු පාසල්හි සිවිල් ආරක්ෂක සාමාජික ව්‍යාප්තිය

සිවිල් ආරක්ෂක සාමාජිකයින්		36523
දිස්ත්‍රික් නිලධාරී	-	19
පාලක/ නියාමක	-	2,436
උප පාලක/ උප නියාමක	-	5,664
සිවිල් ආරක්ෂක	-	28,404

වගු අංක - 3.3.1



ප්‍රස්තාර අංක - 3.3.1

සිවිල් ආරක්ෂක සාමාජික ව්‍යාප්තිය - 2018 දෙසැම්බර් 31 දිනට

බලකාමූලස්ථානය	දිස්ත්‍රික් නිලධාරී		නියාමක		උපනියාමක		සිවිල් ආරක්ෂක		මුළු එකතුව
	පුරුෂ	කාන්තා	පුරුෂ	කාන්තා	පුරුෂ	කාන්තා	පුරුෂ	කාන්තා	
මූලස්ථානය	03	02	16	17	47	84	173	86	**428**
පොළොන්නරුව බලකා මූලස්ථානය			163	07	317	13	1285	73	**1858**
ත්‍රිකුණාමලය බලකා මූලස්ථානය	01		129	17	342	38	1171	56	**1754**
සේරුවිල බලකා මූලස්ථානය			124	06	279	16	1096	54	**1575**
ගෝමරන්කඩවල බලකා මූලස්ථානය			77	06	111	24	752	53	**1023**
කැබිතිගොල්ලෑව බලකා මූලස්ථානය	01		143	03	238	23	1183	67	**1658**
වැලිඔය බලකා මූලස්ථානය	02	01	133	14	245	34	1313	164	**1906**
වව්නියාව බලකා මූලස්ථානය	01		63	30	153	81	703	219	**1250**
අනුරාධපුර බලකා මූලස්ථානය			140	21	337	56	1767	107	**2428**
අම්පාර බලකා මූලස්ථානය		01	168	06	417	40	1881	218	**2731**
මහඔය බලකා මූලස්ථානය			131	05	304	33	1505	179	**2157**
විල්පත්තුව බලකා මූලස්ථානය	01		131	01	317	05	1454	26	**1935**
පුත්තලම බලකා මූලස්ථානය			89	01	196	09	854	16	**1165**
වෙන්නවත්ත බලකා මූලස්ථානය	01		44	04	113	56	608	201	**1027**
හොරොව්පොතාන බලකා මූලස්ථානය			55	01	119	07	643	65	**890**
කතරගම බලකා මූලස්ථානය			57	09	135	19	872	46	**1138**
මහනුවර බලකා මූලස්ථානය			61	07	178	27	639	60	**972**
උහන බලකා මූලස්ථානය		01	90	06	256	57	1220	155	**1785**
කටුනායක බලකා මූලස්ථානය		01	53	04	140	37	636	122	**993**
කිලිනොච්චි බලකා මූලස්ථානය			07		09	01	464	1023	**1504**
මුලතිව් බලකා මූලස්ථානය			06		12		544	949	**1511**
මොණරාගල බලකා මූලස්ථානය	02		200	24	318	45	1796	74	**2459**
මැදිරිගිරිය බලකා මූලස්ථානය			101	07	167	32	1048	14	**1369**
සේරුපිට පුහුණු පාසල		01	09	06	29	28	200	57	**330**
මිහින්තලේ පුහුණු පාසල			10	02	21	16	54	08	**111**
ගල්කිරියාගම උසස් පුහුණු පාසල			04		29	08	78	08	**127**
කල්පිටිය පුහුණු පාසල			07		03		16	04	**30**
පහළලන්ද පහුණු පාසල			08		41	06	44	02	**101**
කුරගල ව්‍යාපෘතිය			01		01	01	166	16	**185**
එකතුව	**12**	**07**	**2220**	**204**	**4874**	**796**	**24165**	**4122**	**36400**

වගු අංක - 3.3.2

4. කාර්ය සාධනය - මූලස්ථානය

4.1 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල් ප්‍රධාන කාර්යාලය මඟින් අනෙකුත් සියලු අංශ සමඟ සම්බන්ධීකරණයෙන් දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කිරීමට කටයුතු කරයි.

4.2 අභ්‍යන්තර විගණන අංශය

අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාකරන අභ්‍යන්තර විගණන අංශය මඟින් දෙපාර්තමේන්තුවට අයත් මූලස්ථානය ඇතුළු සියලුම බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්වල කටයුතු විගණනය කරනු ලබයි.

2018 වර්ෂය තුළ අංශයේ කාර්යසාධනය පහත පරිදි වේ.

අභ්‍යන්තර විගණන අංශය

2018 සැලසුම් වාර්තාව හා තෙවැනි වාර්ෂික සංයුක්ත සැලසුම (2017-2019) අනුව 2018 වර්ෂයේ දී		2018 වර්ෂයේ සත්‍ය ලෙස
ඉටු කිරීමට අපේක්ෂිත වූ කාර්යයන්	අපේක්ෂිත ඉලක්කය (භෞතික/ මූල්‍ය)	ඉටු කර ගත් ඉලක්කය (භෞතික/ මූල්‍ය)
අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	විගණන සැලැස්ම 01	විගණන සැලැස්ම සකස් කර ඉදිරිපත් කර ඇත
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම	රැස්වීම් 04	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා ඇත.
බලකා මූලස්ථාන විගණනය කිරීම	බලකා 23	බලකා 13ක කටයුතු හා ව්‍යාපෘති, භෞතිකව නිරීක්ෂණය කර ඇති අතර බලකා 10කට අයත් ව්‍යාපෘති ආදායම්, වියදම් ගිණුම් පිළිබඳ නියැදි පරීක්ෂා සිදු කරඇත.
පුහුණු පාසල් විගණනය කිරීම	පුහුණු පාසල් 05	පාසල් 3 ක කටයුතු භෞතිකව නිරීක්ෂණය කර ඇති අතර පාසල් 2ක පොත්පත් සහ වවුචර් පරීක්ෂා සිදු කර ඇත.
විශේෂ ව්‍යාපෘති පරීක්ෂාව හා ව්‍යාපෘති ප්‍රගති සමාලෝචනය	විදුලි වැට නඩත්තුව, ඉදිකිරීම් ව්‍යාපෘති, ආරක්ෂක සේවා, වෙනත්	විශේෂ ව්‍යාපෘතීන්ගෙන් නියැදියක් තෝරාගෙන පරීක්ෂාව සහ සැසඳීම් සිදුකර ඇත. ව්‍යාපෘති ප්‍රගති සමාලෝචනය සඳහා උපදෙස් ලබා දී ඇත.
විගණන විමසුම් අඩුකරගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම	වැඩ සටහන් 02	නායකත්ව පුහුණු පාඨමාලාවල අභ්‍යන්තර විගණනය විෂය යටතේ උක්ත පුහුණු සැසියන් පවත්වා ඇත.
ගෙවීම් වවුචර් පරීක්ෂාව	2017 දෙසැම්බර් සිට 2018 නොවැම්බර් දක්වා වවුචර් නියැදි පරීක්ෂාව	මාස 12ක වවුචර්පත් පරීක්ෂා කර ඇත.
රජයේ විගණන විමසුම්වලට පිළිතුරු කැඳවීම	-	විගණන විමසුම්වලට පිළිතුරු විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත යවා විගණන විමසුම් ලේඛනය නිසි පරිදි නඩත්තු කර ඇත.
විශේෂ විමර්ශන සිදුකිරීම	-	විශේෂ විමර්ශන 03ක් සිදු කර ඇත.

වගු අංක - 4.2.1

4.3 සේවා වනිතා ඒකකය

සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සුබසාධනය නංවාලීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වන සේවා වනිතා ඒකකයේ 2018 වර්ෂයේ කාර්යසාධනය පහත පරිදි වේ.

ඒ අනුව අපේක්ෂිත කාර්යයන් අතුරින් කාර්යසාධනයක් පෙන්නුම් නොකරන කාර්යයන් ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ක්‍රියාවට නංවා නොමැත.

සේවා වනිතා ඒකකය				
2018 සැලසුම් වාර්තාව හා තෙවැ වාර්ෂික සංයුක්ත සැලසුම (2017-2019) අනුව 2018 වර්ෂයේ දී			2018 වර්ෂයේ සත්‍ය ලෙස	
ඉටු කිරීමට අපේක්ෂිත වූ කාර්යයන්	වැයකිරීමට අපේක්ෂිත වූ මූල්‍ය පිරිවැය (රු.)	අපේක්ෂිත ඉලක්කය (භෞතික/ මූල්‍ය (රු.)	වැයවූ මූල්‍ය පිරිවැය (රු.)	ඉටු කර ගත් ඉලක්කය (භෞතික/ මූල්‍ය(රු.))
සිවිල් ආරක්ෂක සාමාජික/ සාමාජිකාවන්ගේ දුවා දරුවන් වෙත නොමිලේ අභ්‍යාස පොත් ප්‍රදානය කිරීමේ අටවන අදියර	11,000,000.00	පොත් 34000	13,392,458.67	පාසල් ළමුන් 35,856
දැනුම වර්ධනය හා ස්වයං රැකියාවලට අත්වැලක් සපයාදීම	-	-	-	-
මාසික ධර්ම දේශනා පැවැත්වීම	-	-	10,000.00	ධර්ම දේශනා 12
වෛද්‍යාධාර ලබා දීම	-	-	900,000.00	සාමාජික/ සාමාජිකාවන් 18
5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් සඳහා රු. 15,000.00ක ශිෂ්‍යාධාර ලබා දීම	-	-	-	-
සාමාන්‍ය පෙළ විශිෂ්ට ලෙස සමත් දරුවන් සඳහාරු.40,000.00ක ශිෂ්‍යාධාර ලබා දීම	-	-	-	-
සරසවි වරම් ලැබූ දරුවන් සඳහා ලැප්ටොප් පරිගණක ලබාදීම	-	-	-	-

වගු අංක - 4.3.1

4.4 යහසාධක අරමුදල සහ සුවසවිය අරමුදල

සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සුබසාධනය සඳහා මෙම දෙපාර්තමේන්තුව මඟින් යහසාධක අරමුදල සහ සුවසවිය අරමුදල ක්‍රියාත්මක කරනු ලබයි.

යහසාධක අරමුදල

1997 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම අරමුදල සඳහා සියලුම සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගෙන් රු.450.00ක මාසික සාමාජික මුදලක් අය කෙරේ. සාමාජික අභාවයන් සහ ඥාති අභාවයන් සඳහා අවමංගල්‍යාධාර, නේවාසික වෛද්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රතිලාභ, දු දරුවන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම ආදී කටයුතු මෙම අරමුදල මඟින් සිදු කරයි. තවද එක් සාමාජිකයෙකුගේ සාමාජික මුදලින් රු.10.00ක් ආගමික අරමුදල සඳහා ද 2%ක් ක්‍රීඩා අරමුදල සඳහා ද යොදවයි.

ඒ අනුව එම අරමුදල මඟින් 2018 වර්ෂය තුළ පහත පරිදි ප්‍රතිලාභ ලබා දී ඇත.

යහසාධක අරමුදල				
2018 සැලසුම් වාර්තාව හා තෙවැ වාර්ෂික සංයුක්ත සැලසුම (2017-2019) අනුව 2018 වර්ෂයේ දී			2018 වර්ෂයේ සත්‍ය ලෙස	
විස්තරය	අපේක්ෂිත ලැබීම් (රු.)	අපේක්ෂිත ගෙවීම් (රු.)	ලැබීම් (රු.)	ගෙවීම් (රු.)
සාමාජික මුදල් ලැබීම්	201,000,000.00	-	217,924,994.20	-
සාමාජික මියයාම් සඳහා ප්‍රතිලාභ ගෙවීම	-	25,000,000.00	-	27,587,841.49
විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම	-	68,500,000.00	-	101,737,196.52
වෛද්‍යාධාර ගෙවීම	-	975,000.00	-	11,590,850.00
ඥාති මරණ ප්‍රතිලාභ ගෙවීම	-	37,500,000.00	-	48,690,250.00
අධ්‍යාපන ප්‍රතිලාභ ගෙවීම්	-	20,000,000.00	-	24,815,880.00
සාමාජික මුදල් ආපසු ගෙවීම	-	2,500,000.00	-	2,208,235.00
දුරකථන බිල්පත් පියවීම	-	1,200,00.00	-	710,366.19
තේ පැන් සඳහා දීමනා	-	300,000.00	-	580,940.00
සුළු වියදම්	-	25,000.00	-	3,435.00
	201,000,000.00	**154,800,000.00**	**217,924,994.20**	**217,924,994.20**

වගු අංක - 4.4.1

<u>සුවසවිය අරමුදල</u>

සියලුම සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගෙන් රු. 350.00ක මාසික සාමාජික මුදලක් මෙම අරමුදල සඳහා අය කරනු ලබන අතර අනුමත කොන්දේසි ප්‍රකාරව මියයාම්, රෝහල්ගත වීම්, අසාධ්‍ය රෝග, ආබාධිත වීම් සහ විශේෂ ශල්‍යකර්ම සඳහා ප්‍රතිලාභ ගෙවීම් සිදු කරයි.

ඒ අනුව එම අරමුදල මඟින් 2018 වර්ෂය තුළ පහත පරිදි ප්‍රතිලාභ ලබා දී ඇත.

සුවසවිය අරමුදල				
2018 සැලසුම් වාර්තාව හා තෙවැ වාර්ෂික සංයුක්ත සැලසුම (2017-2019) අනුව 2018 වර්ෂයේ දී			2018 වර්ෂයේ සත්‍ය ලෙස	
විස්තරය	අපේක්ෂිත ලැබීම් (රු.)	අපේක්ෂිත ගෙවීම් (රු.)	ලැබීම් (රු.)	ගෙවීම් (රු.)
සාමාජික මුදල් ලැබීම	154,570,530.00		148,675,932.00	
සාමාජික මියයාම් සඳහා ප්‍රතිලාභ ගෙවීම	-	130,000,000.00	-	94,250,000.00
වෛද්‍යාධාරගෙවීම	-	3,095,000.00	-	4,170,200.00
ඥාති මරණ ප්‍රතිලාභ ගෙවීම	-	13,050,000.00	-	12,300.000.00
ව්‍යවස්ථාවේ සඳහන් රෝගාබාධ සඳහා ප්‍රතිලාභ ගෙවීම	-	3,230,000.00	-	59,680,000.00
ආබාධිත වීම් සඳහා ප්‍රතිලාභ ගෙවීම	-	1,000,000.00	-	2,405,000.00
තේ පැන් දීමනා	-	360,000.00	-	576,380.00

වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීම	-	120,000.00	-	207,516.60
වාර්ෂික විගණන කටයුතු සිදු කිරීම	-	75,000.00	-	38,000.00
	154,570,530.00	**147,700,000.00**	**148,675,932.00**	**161,327,096.60**

වගු අංක - 4.4.1

4.5 **<u>ක්‍රීඩා අංශය</u>**

<u>ක්‍රීඩා අංශය</u>				
2018 සැලසුම් වාර්තාව හා තෙවැනි වාර්ෂික සංයුක්ත සැලසුම (2017-2019) අනුව 2018 වර්ෂයේ දී			**2018 වර්ෂයේ සත්‍ය ලෙස**	
ඉටු කිරීමට අපේක්ෂිත වූ කාර්යයන්	**වැය කිරීමට අපේක්ෂිත වූ මූල්‍ය පිරිවැය (රු.)**	**අපේක්ෂිත ඉලක්කය (හඳුනාගැනීමට අපේක්ෂිත දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණය)**	**වැයවූ මූල්‍ය පිරිවැය (රු.)**	**ඉටු කර ගත් ඉලක්කය (හඳුනාගනු ලැබූ දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ප්‍රමාණය)**
පිහිනුම් තරගාවලිය පැවැත්වීම	600,000.00	13	877,250.00	13
ජීවිතාරක්ෂක තරගාවලිය පැවැත්වීම	500,000.00	20	376,200.00	20
පාපැදි තරගාවලිය පැවැත්වීම	550,000.00	10	462,180.00	10
පාපන්දු ක්‍රීඩා තරගාවලිය පැවැත්වීම	600,000.00	20	833,150.00	20
එල්ලේ තරගාවලිය පැවැත්වීම	600,000.00	32	907,600.00	32
වොලිබෝල් ක්‍රීඩා තරගාවලිය පැවැත්වීම	530,000.00	18	1,105,476.17	18
කරාතේ තරගාවලිය පැවැත්වීම	700,000.00	28	2,348,970.00	28
මලල ක්‍රීඩා තරගාවලිය පැවැත්වීම	1,000,000.00	20	5,242,366.58	20
වෙනත් වියදම්	-	-	3,849,470.00	-
ක්‍රීඩා වර්ණ ප්‍රදාන උත්සවය පැවැත්වීම	50,000,000.00	80	මෙම වර්ෂයේ පවත්වා නොමැත.	

වගු අංක - 4.5.1

4.6 සිවිල් පාලන අංශය

දෙපාර්තමේන්තුවට අනුයුක්ත සිවිල් කාර්ය මණ්ඩලයේ සියලු පරිපාලන කටයුතු, අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ලබාදීම්, ආපදා ණය ගොනු සකස් කිරීම්, දෙපාර්තමේන්තු වක්‍රලේඛ නිකුත් කිරීම් සහ වාර්තා සකස් කිරීම් සිදු කිරීම සිවිල් පාලන අංශය මඟින් සිදු වේ. 2018 වර්ෂයේ කාර්ය සාධනය පහත පරිදි වේ.

සිවිල් පාලන අංශය		
2018 සැලසුම් වාර්තාව හා තෙවැ වාර්ෂිකසංයුක්ත සැලසුම (2017-2019) අනුව 2018 වර්ෂයේදි		**2018 වර්ෂයේ සත්‍ය ලෙස**
ඉටු කිරීමට අපේක්ෂිත වූ කාර්යයන්	**අපේක්ෂිත ඉලක්කය (භෞතික)**	**ඉටු කර ගත් ඉලක්කය (භෞතික)**
2018 වර්ෂයේ පාලන හා මූල්‍ය කටයුතු යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා ආයතනික වක්‍රලේඛ නිකුත් කිරීම	වක්‍රලේඛ 20	වක්‍රලේඛ 25
2017 කාර්ය සාධන වාර්තාව එළි දැක්වීම	පොත් 01	පොත් 01
2019 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	පොත් 01	පොත් 01
දෙපාර්තමේන්තුවෙහි සේවය කරන ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධාරීන්ගේ පරිපාලන කටයුතු සිදුකිරීම හා පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම (පරිපාලන නිලධාරී, සංවර්ධන නිලධාරී, රියදුරු)	පුරප්පාඩු 16	පුරප්පාඩු සබැඳිව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය දැනුවත් කර ඇතත් මෙතෙක් එම පුරප්පාඩු පිරවීමටහැකිවී නොමැත
දෙපාර්තමේන්තුවේ සියලුම සිවිල් නිලධාරීන්ගේ හා සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ ආපදා ණය ඉල්ලුම්පත් සම්බන්ධව කටයුතු සිදුකිරීම	ණය ගොනු 2,250	ණයගොනු 1510ක ප්‍රමාණයක් ගෙවීම් සඳහා ගිණුම් අංශය වෙත යොමු කර ඇත
දෙපාර්තමේන්තු මූලස්ථානයේ හා බලකා මූලස්ථානවල මාසික දුරකථන, පුවත්පත් බිල්පත් හා ගොඩනැගිලි කුලී නිරවුල් කිරීම	බිල්පත් 1,105	බිල්පත් 1455
දෙපාර්තමේන්තුවට අනුයුක්ත ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධාරීන් සඳහා පුහුණු අවස්ථා සම්පාදනය කිරීම	පාඨමාලා 10	පාඨමාලා 20
මූල්‍ය පාලනය සඳහා අධ්‍යක්ෂ (මුදල්) ට සහාය වීම	වවුචර් 3360	වවුචර් 4100
කාර්ය මණ්ඩල සාකච්ඡා පැවැත්වීම හා පසු විපරම් කටයුතු සිදුකිරීම	රැස්වීම් 12	රැස්වීම් 12
අග්‍රහාර අයදුම්පත් හා ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධ කටයුතු සිදුකිරීම	සාමාජිකයින් 4,000	සාමාජිකයින් 3428
මැතිවරණ කටයුතු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු නිලධාරීන් මෙහෙයවීම	-	2018 පළාත් පාලන මැතිවරණය
අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි සිදුකිරීම	-	නියමිත පරිදි ඉටු කර ඇත

වගු අංක - 4.6.1

4.7 වන්දි අංශය

සිවිල් ආරක්ෂක සාමාජිකයින් සඳහා වන්දි ගෙවීම් කටයුතු සිදු කරනුයේ වන්දි අංශය මඟින් වන අතර 2018 වර්ෂය තුළ පහත පරිදි වන්දි ගෙවීම් සිදු කර ඇත.

වන්දි අංශය				
2018 සැලසුම් වාර්තාව හා තෙවැනි වාර්ෂික සංයුක්ත සැලසුම (2017-2019) අනුව 2018 වර්ෂයේ දී			**2018 වර්ෂයේ සත්‍ය ලෙස**	
ඉටු කිරීමට අපේක්ෂිත වූ කාර්යයන්	**වැයකිරීමට අපේක්ෂිත වූ මූල්‍ය පිරිවැය (රු.)**	**අපේක්ෂිත ඉලක්කය (භෞතික/ මූල්‍ය)**	**වැයවූ මූල්‍ය පිරිවැය (රු.)**	**ඉටු කර ගත් ඉලක්කය (භෞතික/ මූල්‍ය)**
ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගෙන් මියගිය හා පූර්ණ ආබාධිත තත්වයට පත්වූ සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ යැපෙන්නන් පිලිබඳ විස්තර සකස් කර මාසික දීමනා ලබාදීම සඳහා වැටුප් අංශය වෙත යොමු කිරීම.	75,763,632.00	සාමාජිකයින් 265	95,038,272.00	සාමාජිකයින් 243ක් සඳහා ගෙවීම් සිදු කර ඇත.
රාජකාරියේ යෙදී සිටියදී මිය යන සිවිල් ආරක්ෂක සාමාජිකයින් සඳහා අවමඟුල් වියදම් ගෙවීම	200,000.00	-	181,100.00	සාමාජිකයින් 05 ක් සඳහා ගෙවීම් සිදු කර ඇත.

වගු අංක - 4.7.1

4.8 ගිණුම් අංශය

අයවැය ප්‍රතිපාදන අනුමත කර ගැනීම සහ වාර්ෂිකව එම ප්‍රතිපාදන දෙපාර්තමේන්තු කාර්යයන් සඳහා යෙදවීමේදී සියලු ගෙවීම් කටයුතු සිදු කිරීම සහ ගිණුම් පවත්වාගෙන යාම ගිණුම් අංශය මඟින් සිදු කරනු ලබයි.

තවද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ව්‍යාපෘති මඟින් උපයන ආදායම් පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම සහ ඒකාබද්ධ අරමුදල වෙත ආදායම් යොමු කිරීම ද සිදු කරයි. ඒ අනුව 2018 වර්ෂයේදී අයවැය ප්‍රතිපාදන යෙදවීම සබැඳිව සාරාංශ වාර්තාව සහ ව්‍යාපෘති ආදායම් වියදම් පිළිබඳ සාරාංශ වාර්තාව පහත ඉදිරිපත් කර ඇත.

අයවැය ප්‍රතිපාදන යෙදවීම් වාර්තාව						
2018 සැලසුම් වාර්තාව හා තෙවැ වාර්ෂික සංයුක්ත සැලසුම (2017-2019) අනුව 2018 වර්ෂයේ දී				2018 වර්ෂයේ සත්‍ය ලෙස		
ඉටුකිරීමට අපේක්ෂිත වූ කාර්යයන්	වැය විෂය අංකය	2018 අපේක්ෂිත අයවැය ප්‍රතිපාදන (රු)	2018 වර්ෂය සඳහා ලද මුළු ශුද්ධ ප්‍රතිපාදන (රු)	වැය වූ මුළු වියදම (රු)	ඉතිරිය (රු)	ඉටුකර ගත් ඉලක්ක (%)
පුද්ගල පඩි නඩි		**16,878,593,000.00**	**16,210,400,000.00**	**15,335,529,483.39**	**874,870,516.61**	**95**
වැටුප් හා වේතන	1001	10,329,856,000.00	9,706,000,000.00	9,373,347,036.69	332,652,963.31	**97**
අතිකාල හා නිවාඩු දින වැටුප්	1002	13,746,000.00	4,400,000.00	4,367,225.41	32,774.59	**99**
වෙනත් දීමනා	1003	6,534,991,000.00	6,500,000,000.00	5,957,815,221.29	542,184,778.71	**92**
ගමන් වියදම්		**20,492,000.00**	**3,600,000.00**	**3,400,115.31**	**199,884.69**	**94**
ගමන් වියදම් - දේශීය	1101	18,492,000.00	2,600,000.00	2,408,994.12	191,005.88	**93**
ගමන් වියදම් - විදේශීය	1102	2,000,000.00	1,000,000.00	991,121.19	8,878.81	**99**
සැපයීම්		**1,009,793,000.00**	**847,500,000.00**	**580,633,061.26**	**266,866,938.74**	**69**
ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	1201	24,829,000.00	15,000,000.00	14,463,849.08	536,150.92	**96**
ඉන්ධන	1202	64,701,000.00	67,000,000.00	66,986,028.77	13,971.23	**100**
ආහාරපාන හා නිල ඇඳුම්	1203	850,473,000.00	707,800,000.00	447,716,361.08	260,083,638.92	**63**
වෛද්‍ය සැපයීම්	1204	1,000,000.00	200,000.00	167,823.46	32,176.54	**84**
වෙනත්	1205	68,790,000.00	57,500,000.00	51,298,998.87	6,201,001.13	**89**
නඩත්තු වියදම්		**220,001,000.00**	**115,620,000.00**	**106,102,740.16**	**9,517,259.84**	**92**
වාහන	1301	88,462,000.00	64,120,000.00	56,318,465.87	7,801,534.13	**88**
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1302	15,000,000.00	8,500,000.00	8,155,694.16	344,305.84	**96**
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	1303	116,539,000.00	43,000,000.00	41,628,580.13	1,371,419.87	**97**
සේවා		**124,752,000.00**	**80,200,000.00**	**75,774,124.77**	**4,425,875.23**	**94**
ප්‍රවාහන	1401	13,000,000.00	5,000,000.00	3,624,176.00	1,375,824.00	**72**
තැපැල් සහ සන්නිවේදන	1402	14,508,000.00	5,600,000.00	4,895,119.52	704,880.48	**87**
විදුලිය සහ ජලය	1403	40,764,000.00	33,000,000.00	32,355,383.07	644,616.93	**98**
බදු කුලී	1404	30,360,000.00	27,000,000.00	26,658,326.69	341,673.31	**99**
වාහන මෙ.ක. වාරික ගෙවීම	1408	14,120,000.00	-	-	-	**0**
වෙනත්	1409	12,000,000.00	9,600,000.00	8,241,119.49	1,358,880.51	**86**

මාරු කිරීම්		**491,341,000.00**	**10,800,000.00**	**10,601,818.16**	**198,181.84**	**98**
සුබසාධන වැඩසටහන්	1501	490,341,000.00	10,600,000.00	10,509,827.50	90,172.50	**99**
රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළී	1506	1,000,000.00	200,000.00	91,990.66	108,009.34	**46**
පුනරාවර්තන එකතුව		**18,744,972,000.00**	**17,268,120,000.00**	**16,112,041,343.05**	**1,156,078,656.95**	**93**
පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම		**108,472,000.00**	**65,000,000.00**	**61,234,790.74**	**3,765,209.26**	**94**
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2001	43,472,000.00	25,000,000.00	24,934,379.90	65,620.10	**100**
යන්ත්‍රෝපකරණ	2002	20,000,000.00	10,000,000.00	7,626,481.03	2,373,518.97	**76**
වාහන අලුත්වැඩියාව	2003	45,000,000.00	30,000,000.00	28,673,929.81	1,326,070.19	**96**
මූලධන වත්කම් අත්පත් කරගැනීම		**1,244,579,000.00**	**105,000,000.00**	**66,328,555.77**	**38,671,444.23**	**63**
වාහන	2101	35,000,000.00	35,000,000.00	-	35,000,000.00	**0**
ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	2102	50,831,000.00	25,000,000.00	24,876,850.61	123,149.39	**100**
යන්ත්‍රෝපකරණ	2103	387,517,000.00	15,000,000.00	14,759,973.04	240,026.96	**98**
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2104	771,231,000.00	30,000,000.00	26,691,732.12	3,308,267.88	**89**
හැකියා වර්ධනය		**35,000,000.00**	**30,000,000.00**	**18,833,634.93**	**11,166,365.07**	**63**
කාර්ය මණ්ඩල පුහුණු	2401	35,000,000.00	30,000,000.00	18,833,634.93	11,166,365.07	**63**
ආදායම් උපයනු ලබන වාණිජ ව්‍යාපෘති		158,832,000.00	115,000,000.00	90,158,644.93	24,841,355.07	**78**
වෙනත් අයෝජන	2509	158,832,000.00	115,000,000.00	90,158,644.93	24,841,355.07	**78**
මූලධන එකතුව		**1,546,883,000.00**	**315,000,000.00**	**236,555,626.37**	**78,444,373.63**	**75**
මුළු එකතුව (පුනරාවර්තන එකතුව + මූලධන එකතුව)		**20,291,855,000.00**	**17,583,120,000.00**	**16,348,596,969.42**	**1,234,523,030.58**	**93**

වගු අංක - 4.8.1

2018 වර්ෂය තුළ බලකා මූලස්ථාන සහ පුහුණු පාසල් මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ආදායම් වාර්තාව					
බලකාය/ පුහුණු පාසල	ආදායම්				
	කෘෂි	ගඩොල්	පශු	වෙනත්	එකතුව
1. අම්පාර	55,762,564.25	3,597,229.00	-	6,327,192.08	65,686,985.33
2. කටුනායක	853,400.00	372,750.00	-	1,897,225.00	3,123,375.00
3. මොණරාගල	22,597,267.00	1,823,006.00	223,516.50	4,770,467.10	29,414,256.60
4. වෙන්නවත්ත	438,828.80	62,900.00	17,140.00	721,790.00	1,240,658.80
5. අනුරාධපුර	4,574,213.25	1,904,415.00	1,165,743.53	3,523,948.00	11,168,319.78
6. කිලිනොච්චිය	8,140,619.50	395,533.91	2,355,777.00	3,024,851.00	13,916,781.41
7. මුලතිව්	12,177,191.00	415,356.00	371,510.00	3,930,644.00	16,894,701.00
8. විශ්වමඩු	-	-	-	-	-
9. ගල්කිරියාගම	-	-	-	-	-
10. කුරගල	2,849,229.00	-	-	-	2,849,229.00
11. පහළලන්ද	-	-	-	-	-
12. කල්පිටිය	-	-	-	-	-
13. මහනුවර	252,379.00	-	-	2,380,124.95	2,632,503.95
14. පුත්තලම	3,724,982.50	269,720.00	11,709,942.57	703,903.50	16,408,548.57
15. කතරගම	316,415.00	-	64,000.00	1,907,000.00	2,287,415.00
16. මහඔය	27,650,027.45	989,207.00	757,705.00	6,695,037.33	36,091,976.78
17. සේරුවිල	2,796,872.50	-	524,612.89	2,559,564.54	5,881,049.93
18. ගෝමරන්කඩවල	7,163,635.60	1,736,178.00	571,632.35	2,137,316.00	11,608,761.95
19. පොළොන්නරුව	5,878,226.00	1,555,452.00	2,326,756.88	11,616,733.99	21,377,168.87
20.හොරොව්පොතාන	4,550,928.72	2,079,464.00	3,460,799.00	1,675,969.39	11,767,161.11
21. උහන	10,542,646.50	460,296.00	342,584.00	5,047,564.00	16,393,090.50
22. කැබිතිගොල්ලෑව	6,598,938.85	2,420,594.50	381,810.07	1,740,810.58	11,142,154.00
23. විල්පත්තුව	6,230,143.00	1,113,768.00	1,016,254.00	882,591.00	9,242,756.00
24. කන්තලේ	9,766,801.65	7,828,099.00	868,287.34	544,426.50	19,007,614.49
25. වැලිඔය	5,731,158.40	3,336,143.30	1,106,044.32	4,635,904.33	14,809,250.35
26. මැදිරිගිරිය	2,660,104.00	8,011,970.00	1,400,249.85	801,905.00	12,874,228.85
27. වව්නියාව	5,248,800.98	2,029,287.00	28,000.00	1,029,355.00	8,335,442.98

28. කොණ්ඩච්චිය	32,224,915.00	-	-	-	32,224,915.00
29.මිහින්තලය	-	-	-	4,402.83	4,402.83
30.කල්පිටිය	-	-	-	12,441.00	12,441.00
31.සේරුපිට	-	-	-	255,230.00	255,230.00
මුළු ආදායම					**375,409,760.28**
මුළු වියදම					**90,158,644.93**
ශුද්ධ ලාභය					**285,251,115.35**

වගු අංක - 4.8.2

4.9 වැටුප් අංශය

දෙපාර්තමේන්තුවට අනුයුක්ත සිවිල් ආරක්ෂක සාමාජික සාමාජිකාවන්ගේ මාසික වේතන ගෙවීම් කටයුතු වැටුප් අංශය මඟින් සිදු කරනු ලබන අතර 2018 වර්ෂයේ වැටුප් ගෙවීම් වාර්තාව පහත වේ.

2018 වසරේ වැටුප් ගෙවීම් වාර්තාව (මිලියන)

මාසය	දිස්ත්‍රික් නිලධාරී		නියාමක		උප නියාමක		සිවිල් ආරක්ෂක		මියගිය/ආබාධිත		මුළු එකතුව	
	සංඛ්‍යාව	මුදල	සංඛ්‍යාව	මුදල	සංඛ්‍යාව	මුදල	සංඛ්‍යාව	මුදල	සංඛ්‍යාව	මුදල	සංඛ්‍යාව	මුදල
ජනවාරි	20	0.65	2500	78.64	5724	172.02	28798	805.61	299	6.56	37341	1,063.48
පෙබරවාරි	20	0.66	2496	77.88	5713	170.98	28773	801.99	299	6.54	37301	1,058.05
මාර්තු	20	0.64	2491	77.43	5709	169.70	28748	800.17	303	6.68	37271	1,054.62
අප්‍රේල්	20	0.65	2489	77.39	5708	169.28	28738	796.35	308	6.89	37263	1,050.56
මැයි	20	0.63	2479	75.32	5694	167.50	28620	782.60	304	6.74	37117	1,032.79
ජූනි	19	0.60	2478	75.90	6582	167.12	28583	786.55	312	6.83	37074	1,037.00
ජූලි	19	0.60	2475	75.48	5674	164.79	28524	778.32	296	6.54	36988	1,025.73
අගෝස්තු	18	0.57	2466	75.62	5672	167.29	29787	821.65	297	6.51	38240	1,071.64
සැප්තැම්බර්	19	0.60	2459	75.38	5670	166.95	28441	784.86	288	6.34	36877	1,034.13
ඔක්තෝබර්	19	0.60	2451	74.74	5667	166.52	28384	780.30	299	6.54	36820	1,028.70
නොවැම්බර්	19	0.59	2442	74.13	5663	165.27	28321	774.89	293	6.44	36738	1,021.32
දෙසැම්බර්	19	0.60	2433	75.24	5655	167.00	28260	781.95	286	0.63	36653	1,025.92
එකතුව		**7.39**		**913.15**		**2,014.92**		**9,495.24**		**73.24**		**12,503.94**

වගු අංක - 4.9.1

4.10 ප්‍රසම්පාදන අංශය

දෙපාර්තමේන්තු මූලස්ථානය ඇතුළු සියලුම බලකා සහ පුහුණු පාසල් සඳහා අවශ්‍ය සියලුම ද්‍රව්‍ය මිලදී ගැනීමේ ක්‍රියාපටිපාටිය ප්‍රසම්පාදන අංශය මඟින් සිදු කෙරේ. 2018 වර්ෂයේ මිලදී ගැනීම් පිළිබඳ වාර්තාව පහත ඉදිරිපත් කර ඇත.

ප්‍රසම්පාදන අංශය					
